# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1765/9 – 2012 ජූලි 04 වැනි බදාදා – 2012.07.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2008 පෙබරවාරි මස 01 වැනි දින අංක 1534/23 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2008 අංක 28 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතුවී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙහි 1 වන උපලේඛනයෙහි සඳහන් එකී ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2006/ඩබ්එස්/265.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ප්‍රාලේ/බ/ඉ/1/2/107.
2012 ජුනි මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදකෝරළේ හෙළඋඩපළාත සුළු කොට්ඨාසයේ ඇල්ලේවත්ත (කැසි 620087) කලාප 1) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ආර්/බීඑල්එන්/2006/880 හා 2007.04.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.6067ක් පමණ වූ වැවේවත්ත, පිටුමුල්ලේවත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වැවේවත්ත, පිටමුල්ලේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.6067ක් පමණ**

උතුරට: ඒ. සී. කීගල් හිමිකම් කියන වැවේවත්ත; නැගෙනහිරට: ඒ. සී. කීගල් හිමිකම් කියන වැවේවත්ත සහ වලවේ ගඟ; දකුණට: වලවේ ගඟ සහ ඊ. ඒ. ප්‍රේමවර්ධන හිමිකම් කියන ඇලලේවත්ත; බටහිරට: ඊ. ඒ. ප්‍රේමවර්ධන හිමිකම් කියන ඇලලේවත්ත, මාර්ගය සහ ඒ. සී. කීගල් හිමිකම් කියන වැවේවත්ත.

07 - 508

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2011 අංක 246 දරන ආඥාව**

මගේ අංකය: 4/3/9/2011/IR/99.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ඇඉ/2/4/අප/10.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට යටත්ව අංක 1731/18 හා 2011.11.09 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී*

*ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 2ඒ පිටුවේ පළකරන ලද 2011 අංක 246 දරන ආඥාවේ ඉඩමේ විස්තරය යටතේ සඳහන් ''මධ්‍යම පළාතේ'' යන්න ඉවත් කොට ඒ වෙනුවට ''ඌව පළාතේ'' යන්න ආදේශ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 ජුනි මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 509

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 103 දරන ආඥාව**

මගේ අංකය: එල්ඩී/05/2008/එච්ඩබ්/68.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/2/3/10/245.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට යටත්ව අංක 1759/36 හා 2012.05.25 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2012 අංක 103 දරන ආඥාවේ 1ඒ පිටුවේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා - ප්‍රාදේශීය ලේකම්, ගම්පහ යන්න ඉවත් කර ඒ වෙනුවට ''ප්‍රාදේශීය ලේකම්, අත්තනගල්ල'' යන්න ආදේශ විය යුතු බවත්, ඉඩමේ විස්තරය යටතේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් ඇතුළත් වන පරිදි ඉහත ආඥාව සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 ජුනි මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

01. **කැබලි අංක 186 – බෝධියන්දෙණිය කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0218**
උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, බී. පී. එම්. රොද්‍රිගු හිමිකම් කියන කුරුඳුවත්ත හා කැබලි අංක 185; නැගෙනහිරට: නුවර පාර; දකුණට: නුවර පාර, කැබලි අංක 187 හා ඇළ; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

02. **කැබලි අංක 187 – ප්‍රමාණය: හෙක්. 0.0047**
උතුරට: හිමිකම් කියන අය නොදන්නා බෝධියන්දෙනිය කුඹුර හා කැබලි අංක 186; නැගෙනහිරට: කැබලි අංක 186 හා නුවර පාර; දකුණට: නුවර පාර හා කැබලි අංක 188; බටහිරට: කැබලි අංක 188, වරි. අංක 585 දරන භූමිය (නුවර පාර).

03. **කැබලි අංක 539 – ප්‍රමාණය: හෙක්. 0.0014**
උතුරට: නුවර පාර හා කැබලි අංක 540; නැගෙනහිරට: කැබලි අංක 540, කේ. ඒ. ඒ. ජේ. ආර්. කුරුප්පු හිමිකම් කියන බෝධියන්දෙනියේ කුඹුර සහ ඇළ; දකුණට: ඇළ, වරි. අංක 534/1 දරන භූමිය (නුවර පාර) හා කැබලි අංක 538; බටහිරට: කැබලි අංක 538 හා නුවර පාර.

04. **කැබලි අංක 540 – බෝධියන්දෙණිය කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0064**
උතුරට: නුවර පාර හා කැබලි අංක 541; නැගෙනහිරට: කැබලි අංක 540, එල්. ඒ. ඒ. අධිකාරි හිමිකම් කියන බෝධියන්දෙනියේ කුඹුර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස, ඇළ හා කැබලි අංක 539; බටහිරට: නුවර පාර.

07 - 510

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

මගේ යොමු අංකය: 03ජේ/82/එල්ජී/159.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කො.ප්‍රා.ලේ/03/05/01/04.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39අ (1) වැනි වගන්තිය යටතේ නියමයට යටත්ව අංක 1759/42 හා 2012.02.25 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 1ඒ පිටුවේ පළකරන ලද 39අ (1) වැනි වගන්තිය යටතේ නියමයෙහි පළමු ඡේදයෙහි 1983 මැයි මස 30 වැනි දින අංක 347/2 දරන ගැසට් අංකය වෙනුවට 1983 මැයි මස 30 වැනි දින අංක 247/2 ලෙස ගැසට් අංකය සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 ජුනි මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 511

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.